# වයඹ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන්ගේ ශිෂ්‍යත්ව වැඩසටහන

## වයඹ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන්ගේ සුභසාධන සංගමය (WUTWAS)

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

## කුලියාපිටිය

දරුවන්ගේ අධ්‍යාපනයේ සාර්ථකත්වය, දෙමාපියාන්ගේ සමාජ ආර්ථික තත්වය මත, සැලකිය යුතු ලෙස රඳාපවතින බව පරීක්ෂණ මගින් සනාථ වී ඇත. එම නිසා, සමාජ ආර්ථික තත්වය ඉතා පහළ මට්ටමක පවතින දරුදැරියන් වෙනුවෙන් මුල්‍යමය ආධාර ලබාදීම තුළින් ශ්‍රී ලාංකිකයින්ගේ, තිරසාර සංවර්ධනය ලඟා කරාගත හැකි බව අප විශ්වාස කරමු. එසේම නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ඵල ලබා ගත් පිරිසක් වශයෙන්, එම සිසුන් හට සහයෝගය දැක්වීම විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය වශයෙන් අප සතු වගකීමක් ලෙස අප දකිමු.

**ශිෂ්‍යයන් තෝරාගැනීම**

මුලික පියවරක් වශයෙන් අපි භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, වාණිජ විද්‍යාව හා තාක්ෂණ විෂය ධාරාවන් හරහා උසස් පෙළ හැදැරීමට බලාපොරොත්තු වන දරුදැරියන් හට ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමු (අප සාමාජිකත්වය නියෝජනය කරනු ලබන පීඨයන්).

අ.පො.ස. සා/පෙළ සමත් නිසි සුදුසුකම් සපුරාලන දරු දැරියන් හට මෙම ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ හැකිය. අයදුම්පත් කැඳවීම වයඹ පළාතේ පාසල් විදුහල්පති වරුන් හරහා සිදු කරනු ලැබෙන අතර, නිසි සුදුසුකම් සපුරන සිසුන්ගේ අයදුම්පත්, නිශ්චිත ඇගයීමේ ක්‍රමවේදයට අනුව ශ්‍රේණිගත කෙරේ.

යම් වර්ෂයක් සඳහා ලබාදෙනු ලබන ශිෂ්‍යත්ව ප්‍රමාණය, එම වසරේ මුල්‍යමය සම්පත් ප්‍රමාණය මත තීරණය කෙරේ.

**ශිෂ්‍යත්වය පිළිබඳ විස්තර**

ශිෂ්‍යත්වය රුපියල් 2,500.00 ක මාසික දීමනාවක් වන අතර එය උපරිම වශයෙන් මාස 24 ක් සඳහා ලබා දෙනු ලැබේ. සෑම මාසයක් ආරම්භයේදීම මෙම දීමනාව ශිෂ්‍යත්වලාභියාගේ බැංකු ගිණුමට සෘජුවම, බැර කරනු ලැබේ. සැම වාරයක් අවසානයේදීම, ශිෂ්‍යත්වලාභියා විසින් විදුහල්පති සහතික කළ ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. වාර විභාග ප්‍රතිඵල නිකුත් වී සති දෙකක් ඇතුළත මෙම වාර්තා ඉදිරිපත් කළ යුතුය. ශිෂ්‍යත්වලාභියාගේ ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි නම්, ඒ පිළිබඳව ලිපියකින් දැනුම් දෙනු ලබන අතර, ඊට පසුවද ප්‍රගතියක් පෙන්වීමට අපොහසත් වන ශිෂ්‍යත්වලාභින්ගේ ශිෂ්‍යත්වය අත්හිටුවන අතර, ඉතිරි මුදල් මීළඟ වසරේ තේරීම් වටයට බැර කෙරේ (නිර්ණායකයන් පහත දක්වා ඇත).

**යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා WUTWAS හි කාර්යභාරය**

මුලික පියවරක් වශයෙන්, මුල් වටයේ සිසුන් දෙදෙනෙකු සඳහා වයඹ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සුභසාධන සංගමය විසින් අරමුදල් සපයයි. ශිෂ්‍යයකු සඳහා මාස 24 ක් (රුපියල් 60,000.00) අරමුදල් පරිත්‍යාග කිරීමට කැමති ඕනෑම පුද්ගලයෙක් හෝ පුද්ගලයන් හෝ ආයතනයන් හට ආරාධනා කරන අතර, මෙම වැඩසටහන සඳහා WUTWAS විසින් පත් කරන ලද කමිටුවක් විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. ශිෂ්‍යයත්ව දෙකකට වඩා ප්‍රදානය කිරීමට

ප්‍රමාණවත් මුදල් පරිත්‍යාගයන් ලැබෙන අවස්ථාවන්හිදී, එම වර්ෂය සඳහා WUTWAS විසින් සිය අරමුදල් නිකුත් කරනු නොලබයි.

**ශිෂ්‍යයත්වලාභීන් සංඛ්‍යාව**

අරමුදල් ලබාගත හැකි වීමත් සමග එම සංඛ්‍යාව තිරණය කරනු ලබන අතර, අවම වශයෙන් වසරකට ශිෂ්‍යයත්වලාභීන් දෙදෙනෙකු සඳහා ශිෂ්‍යයත්වය ලබාදෙනු ලැබේ.

**සුදුසුකම් නිර්ණායක**

01. අයදුම්කරු රුපියල් 40,000.00 නොවැඩි මාසික ආදායමක් ලබන අඩු ආදායම්ලාභී පවුලක සාමාජිකයෙකු විය යුතුය.
02. අයදුම්කරු අ.පො.ස. සා/පෙළ සමත්ව, ඉහත සඳහන් විෂය ධාරාවන්හි අ.පො.ස. උසස් පෙළ පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා සිටිය යුතුය.

**ඇගයීම් නිර්ණායක**

ලබා දී ඇති නිර්ණායකයන්ට අනුකූලව ලකුණු ලබා දෙන අතර, අවසාන තීරණය ගනු ලබන්නේ WUTWAS හි ශිෂ්‍යත්ව ප්‍රධාන කිරීමේ කමිටුව විසිනි. පහත සඳහන් සාදක මේ සඳහා සළකා ලබනු ලැබේ.

01. පවුලේ ආදායම හෝ සමාජ ආර්ථික පසුබිම
    a) දළ ආදායම
    b) පවුලේ යැපෙන්නන් ගණන
02. අ.පො.ස. සා/පෙළ සමත්වීම හා අ.පො.ස. උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලබා තිබීම
03. අධ්‍යාපන කටයුතු තුළින් 6 ශ්‍රේණියේ සිට ලබා ඇති ජාතික, පළාත්, දිස්ත්‍රික් හා පාසල් මට්ටමේ ජයග්‍රහණ
04. විෂය බාහිර ක්‍රියාකාරකම් තුළින් 6 ශ්‍රේණියේ සිට ලබා ඇති ජාතික, පළාත්, දිස්ත්‍රික් හා පාසල් මට්ටමේ ජයග්‍රහණ

**ශිෂ්‍යත්වලාභියා සතුටුදායක ප්‍රගතියක් ලබාදීමට අසමත් වුවහොත් ශිෂ්‍යත්වය අත්හිටුවනු ඇත.**

1. නියමිත කාල සීමාව තුළ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමට අපොහසත් වීම (සෑම වාරයක් අවසානයේදීම, වාර විභාග ප්‍රතිඵල නිකුත් වී සති දෙකක් ඇතුළත)
   හෝ
2. විෂයක් සඳහා (සාමාන්‍ය ඉංග්‍රිසි හැර) අවම වශයෙන් ලකුණු 50 ක් අඛණ්ඩව වාර දෙකකින් ලබා ගැනීමට නොහැකි වීම (ප්‍රගතිය සතුටුදායක නොවේ නම් ඒ පිළිබඳ ලිපියකින් දන්වනු ලැබේ)
   හෝ
3. පාසල් විභාගයේදී ශිෂ්‍යයා කිසියම් වරදකට වරදකරු වීම හෝ රජයේ නීතියට අනුව නීති විරෝධී වරදකට වරදකරු වීම (ප්‍රගති වාර්තා වල දක්වා ඇති තොරතුරු මේ සඳහා සලකා බලනු ලැබේ)

ඔබගේ අයදුම්පත, අයදුම්පත් බාරගන්නා අවසන් දිනට පෙර පහත ලිපිනයට ලැබීමට සලස්වන්න.

ලේකම්, වයඹ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන්ගේ සුභසාධන සංගමය (WUTWAS),

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

කුලියාපිටිය